# වෂර් 2021 ක්වූ ජූනි මස 17 වන දින උඩපළාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

- පැමිණීම

| | |
|---|---|
| 01.D.G ගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතරී රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05. .S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08 M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09. A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10.D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11. D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13. D.M දීසායු මංජුල දිසානායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14. D.G ජයන්ත කීතරීසිංහ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15.R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16. H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17. M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19. තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.N.R.M.D නවරත්න රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22.M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.H.G සුසිලාවති මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |
| 24.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය |

25.වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26.මුතු නීලමේගම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

27.G.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28 .පිච්චෙයි සෙල්වපූනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29. ගයානි ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්

30. W.M.G.W.C.B වේරපිටිය මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

31. R.M උදයකුමාර දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

32. W.ප්‍රේමතිලක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

33. A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

34. W.D.G ගුණතිලක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

35. G.A අරුණ ප්‍රසන්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

36. A.C මොහොමඩ් ෆසාල් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37. කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38. K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39. P.T.G චයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

40. H.G සුබද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

41. K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

42. සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

43. චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරිම

පසුගිය මැයි මස 18 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පසුගිය මැයි මස 18 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

පසුගිය මැයි මස 18 වන දින මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිලිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>

**ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

1.තමා න්‍යාය පත්‍රය නොඑවා දුරකථනයෙන් දන්වා සභාව පැවැත්වීමට කටයුතු කලේ භයානක තත්වයක් පවතින නිසා බවත් සීමිත ප්‍රමාණයක් කැදවා තීන්දු තීරණ ලබාගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් හා උඩපළාත සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කායර්ාලයේ සෞඛ්‍ය නීති වලට අනුගතව ඉතා ඉක්මනින් කටයුතු අවසන් කරන ලෙස උපදෙස් ලැබුණු නිසා බවත් එනිසා තමා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගෙන් ආරක්ෂාකාරීව සෞඛ්‍ය පිළිවෙත් වලට අනුව ජීවත් වන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින ලදි.තවද අපේ ගරු මන්ත්‍රීතුමියකට කොරෝනා වසංගතය ආසාදනය වී ඇති බවත් එතුමිය දින 14ක් නිරෝධායනය වී පැමිණි පසු එතුමියගේ පියා සහ දරුවා කොරෝනා වෛරසය ආසාදනය වී නිරෝධායනය සඳහා රැගෙන ගිය බවත් මහ සභාව දැනුවත් කරන ලදි.

<u>3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සඳහන් කරන ලදි.

<u>4.කල් දී ඇති ප්‍රශ්න</u> - නොමැති බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>5.කල් දී ඇති යෝජනා</u>

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (1)

5 (1 .1) පුස්සැල්ලාව බහුකායර් ගොඩනැගිල්ල ඇස්තමේන්තුව සහ සැලසුම් සකස් කිරීමේ වියදම මුළු ඇස්තමේන්තු මුදලින් 6.5% ක් (රු.6500000.00) නාගරික සංවධර්න අධිකාරියට ගෙවීමටත් පළමුව මුළු උපදේශන ගාස්තුවෙන් 5% මුදලක් අත්තිකාරම් ලෙස අය කරන බව දන්වා ඇති බැවින් මේ සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

පුස්සැල්ලාව නගරයේ ඉදිවන බහුකායර් ගොඩනැගිල්ල ගරු සභාපතිතුමාගේ සහ අපි සියළු දෙනාගේම යෝජනාවක් බවත් නාගරික සංවධර්න අධිකාරියට ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ඇස්තමේන්තු සහ සැළසුම් සකස් කිරීම සඳහා රු. 6500000.00 මුදලක් වැය වන බවත් එම ඉඩම ගැන ප්‍රශ්නයක් තිබූ බවත් එය නිරාකරණය වී ඇතිද යන්නත් නැතිනම් ගැටළු මතුවන බවත් එනිසා ලේකම්තුමිය මේ සම්බන්ධයෙන් සොයා බලා අනතුරුව මුදල් ගෙවිය යුතු බවත් නාගරික සංවධර්න අධිකාරියේ සමහර ව්‍යාපෘති වැරදුන අවස්ථා ඇති බවත් ගම්පොල නගර සභාවේ ගොඩනැගිල්ල ඉන් එකක් බවත් නාවලපිටිය රෝහලේ ස්ලැබ් එකේ ජලය කාන්දු වන බවත් එනිසා ඊට වඩා දැනුමක් අපේ මන්ත්‍රීවරුන්ට තිබෙන බවත් එනිසා පුස්සැල්ලාව බහුකායර් ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය කරන 6.5% මුදල හා ආරම්භයේදී 1.5% මුදල ගෙවීම අනුමත කරන බවත් පුස්සැල්ලාව ගොඩනැගිල්ල අපේ පොදු වස්තුවක් ලෙස ප්‍රදේශවාසීන්ට අත්වන බවත් එනිසා කමිටුවක් සාදා මන්ත්‍රී මණ්ඩලයේ දැනුමද ලබාගෙන කමිටුව හරහා යම් යම් දේ ක්‍රියාත්මක කල යුතු බවත් වැසිකිළි සකස් කිරීමේදි බට දැමීම ගැන අවධානය යොමු කල යුතු බවත් සමහර කාමරීක නිළධාරි මහතුන්ට වඩා දැනුමක් දේශපාලන අධිකාරියේ අයට ඇති බවත් අපේ මන්ත්‍රීවරු 43 දෙනෙකු සිටින නිසා එම අයගේ නම් පවතින පරිදි කටයුතු කල යුතු බවත් සමහර සභා වල සභාපතිවරුන්ගේ නම් පවතින පරිදි යම් යම් ස්ථාන වල සටහන් කර ඇති බවත් පුස්සැල්ලාව ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කල යුතු බවත් සභා කාලය පවතින කාලයේ මුල්ගල තැබීම කල යුතු බවත් සඳහන් කරමින් පුස්සැල්ලාව බහුකායර් ගොඩනැගිල්ල ඇස්තමේන්තුව සහ සැලසුම් සකස් කිරීමේ වියදම මුළු ඇස්තමේන්තු මුදලින් 6.5% ක් (රු.6500000.00) නාගරික සංවධර්න අධිකාරියට ගෙවීමටත් පළමුව මුළු උපදේශන ගාස්තුවෙන් 5% මුදලක් අත්තිකාරම් ලෙස ගෙවීමටත් මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

දොළුව ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදිකිරීම ඉතා ඉක්මනින ආරම්භ කරන ලෙසත් යෝජනා කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

අපේ පුස්සැල්ලාව වෙළඳ සංකීණර්යේ අඩුපාඩු විශාල සංඛ්‍යාවක් ඇති බවත් අපි පුස්සැල්ලාව නගර ශාලා ඉඩමෙන්ද ප්‍රයෝජනයක් ගෙන නොමැති බවත් වෙළඳ සංකීණර්යේ කඩ කාමර වල ඉඩ පහසුකම් මදි බැවින් වෙළඳුන් කඩ කාමර ලබාගැනීමට මැළිකමක් දක්වන බවත් එනිසා පුස්සැල්ලාව බහුකායර් ගොඩනැගිල්ලේ සැළසුම ඇදිමට පෙර ඒ සඳහා අවශ්‍ය නිණර්ායක අපේ සභාවේ මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කර මේ මේ ආකාරයෙන් සිදුවිය යුතු

බවත් කඩ කාමර මෙතරම් ප්‍රමාණයෙන් තිබිය යුතු බවත් දක්වා අපි අපේ කාමරීක නිළධාරි මහතුන් ලවා දළ සටහනක් මඟින් සාකච්ඡා කරගත යුතු බවත් තමා යෝජනා කරන බවත් එසේ නොමැති වූවත් අපි ප්ලෑන අනුමත කරන බවත් නමුත් අවසානයේ අවශ්‍ය ලෙස වැඩ කටයුතු සිදු නොවන බවත් මෙනිසා අපි මන්ත්‍රීවරු භූමියේ ආකාරයට කෙළෙස කටයුතු කරනවාද කියා සාකච්ඡා කල යුතු බවත් මේ සඳහා නිවැරදි සැළසුමක් සකස් කරගත යුතු බවත් සදහන් කරන ලදි.අපි රු. මිලියන 80ක් වැය කර ආරම්භ කල වත්තේහේනේ ජල යෝජනා ක්‍රමය අපට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක නොවූ බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පුස්සැල්ලාව වෙළඳ සංකීණර්ය හදන්න මුල්ගල තැබුවත් අපේ සභා කාලය අවසන් වීම නිසා ඒ ගැන සොයා බලන්න නොහැකි වු නිසා ගැටළු පැන නැඟී ඇති බවත් මෙවර එසේ සිදු නොවන බවත් මූලික වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙර අපි ප්‍රදේශයේ මන්ත්‍රීවරු හා අනෙකුත් මන්ත්‍රී මණ්ඩලය එක්ව කමිටුවක් පත් කර කටයුතු සිදුකරන බවත් ඔබතුමාලාගේ උපදෙස් පරිදි කටයුතු කරන බවත් වෙළඳ සංකීණර්යේ කඩ කාමර සාදා බදුදීම් පවා අපි නැවත සභාවට පැමිණෙන විට අවසන් කර තිබූ බවත් සදහන් කරන ලදි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

අපි කාලයක් තිස්සේ යෝජනා කර තිබුනේ සභාවට දැනෙන කටයුත්තක් කිරීමට බවත් ඒ අනුව අපි මේ කටයුතු අපේ අධීක්ෂණය යටතේ සිදුකිරීම වැදගත් බවත් අපි උඩපළාතේ සැදූ දේවල් අසාථර්ක වී ඇති බවත් දොළුවේ සිට කුඩා නගර සැදුවත් ඒවාද අසාථර්ක වූ බවත් පුස්සැල්ලාව වෙළඳ සංකීණර්යද අසාථර්ක වූ බවත් මෙවැනි ව්‍යාපෘති තෝරාගෙන සාථර්කව ඉටුකිරීම අපි සියළු දෙනාගේ වගකීම බවත් එනිසා පරිසර සංකල්ප වලට අනුගතව ගස් කොළන් සමඟ අළුතින් නගර ඉදිකරන ගොඩනැගිලි සැලැස්මවල් අනුව ආලෝකය ලැබෙන පරිදි කටයුතු කල යුතු බවත් මුල්ගල් තබනවාට වඩා අළුතින් ඉදිකරන ඉදිකිරීම් සම්පූණර්යෙන් අවසන් කරන ලෙස රජය දැනුම් දී ඇති නිසා අපේ කාලය තුළ සියළු දේවල් නිවැරදිව සකස් කරගමු යැයි සඳහන් කරන ලදි.

<u>ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා</u>

නාගරික සංවධර්න අධිකාරියට ඇස්තමේන්තු කිරීමේදී යම්කිසි මුදලක් ගෙවිය යුතු බවත් කෝටි 10ක ඉලක්කයකට යන අවස්ථාවේ නාගරික සංවධර්න අධිකාරියට ලක්ෂ 65ක මුදලක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවිය යුතු බවත් මෙයට සැලසුම් සකස් කිරීම හා වියදම් ඇස්තමේන්තු යන දේවල් ඇතුළත් ව ගෙවීම් කල යුතු බවත් 6.5% ගෙවීම් අනුමැතිය සඳහා ඉල්ලා ඇති බවත් නමුත් අදාළ ස්ථානීය පරීක්ෂාව ආදි කටයුතු සඳහා මූලික ගෙවීම ලෙස රු.325000.00 ඉල්ලා ඇති බවත් අදියරෙන් අදියර මෙම වැඩ කටයුතු සිදු වන විට අදාළ ගෙවීම් සිදු කරන බවත් සහභාගී වන නිළධාරින්ට එම අය ගෙවීම් කරන බවත් පූණර් අධීක්ෂණය සිදුකරන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

පුස්සැල්ලාව බහුකායර් ගොඩනැගිල්ල ගැන කථා කර එය අනුමත වූ බවත් දොළුව ප්‍රදේශයේ ආදාහනාගාරය සඳහා ගුරුකැලේ වසමේ බුම්මලේ ප්‍රදේශය තෝරාගෙන ප්‍රදේශයට අත්‍යාවශ්‍ය යෝජනාවක් ලෙස ඉටු කර දෙන ලෙසත් එය ඉතා වැදගත් බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ආදාහනාගාරයට අදාල සැළසුම් අපි ළග නොමැති නිසා තමා පරිසර අමාත්‍යාංශයෙන් සැළසුම් විස්තර ඉල්ලා ඇති බවත් අපි කොරෝනා වසංගත කාලයෙන් පසු මන්ත්‍රී මණ්ඩලය සමඟ සාකච්ඡා කර කටයුතු ඉටුකර ගමු යැයිද අපි ටෙන්ඩර් කර පුවත්පත්වල සඳහන් කර ලබාදෙන බවත් ඉඩම නිරවුල් කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට දන්වා යවා ඇති බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (2)

5(1.2) සභාව සතු PB-7657 කෘෘ කැබ් රථය සහ 252-6339 දරන වාහන මහ නැඟුම ආයතනය වසා ඇති නිසා කොරෝනා වසංගත තත්වය මත හදිසි රාජකාරි සඳහා යෙදවීමට ඇති නිසා මෙම වාහන වල මෙන්ම අනෙකුත් සියළු වාහන වල සේවා සැපයුම් සහ සුළු අළුත්වැඩියා කටයුතු දැනට විවෘතව ඇති වෙනත් සේවා ස්ථානයකින් හෝ ගරාජයකින් ඉටුකර ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**

දැනට ගම්පොල කීරපනේ සවරීස් කරන ආයතනයක් විවෘත කර ඇති නිසා එම ආයතනයෙන් සේවා කටයුතු ඉටු කර ගන්නා ලෙසට සඳහන් කරන ලදි.

**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**

ගම්පොල ප්‍රදේශයේ විවෘත කර ඇති ආයතනයකින් සභාවේ නිළධාරින්ගේ අධීක්ෂණය යටතේ කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සංවරණ සීමා පවතින කාල සීමාව තුළදී පමණක් සභාව සතු සියළුම වාහන අළුත්වැඩියාව සහ සේවා සැපයුම් කටයුතු සඳහා ප්‍රායෝගික ගැටළු මතු වන නිසා අනිවායර්යෙන්ම කල යුතු කරුණු ලෙස සලකා ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05 .1 (3)

5(1.3) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මිය යන පුද්ගලයින්ගේ මෘත දේහ ආදාහනය සඳහා අනුග්‍රහ දැක්වීම යන කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක CPC/CLG/1/11 COVID 19 හා 2021.06.10 දිනැති ලිපියට අනුව කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මිය යන ආථර්ික දුෂ්කරතා සහිත පවුල් වල සාමාජිකයින්ගේ මෘත දේහ ආදාහනය කිරීමේදී මුදල් අය කිරීමකින් තොරව ඉටු කරදීම සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

දින අටක දරුවෙක් අපි ආදාහනය කල බවත් එම අයට මුදල් ගෙවීමට හැකියාවක් නොමැති බවත් එම නිවසේ අය නිරෝධායනය කර තිබූ බවත් අසරණ පවුලක් නිසා මුදල් ලබා ගැනීමකින් තොරව පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් අනුව කටයුතු කල බවත් තවද වහුගපිටිය රෝහල අසළ බස් නැවතුමේ කාන්තාවක් මිය ගොස් දින 3කට පසු කුනු වී තිබූ මළ සිරුර පොලීසියෙන් කථා කල පසු අපේ රියදුරන් හා කම්කරුවන් එකතුව රැගෙන ගිය බවත් මින් ඉදිරියේදි මෙලෙස කොරෝනා වසංගතය නිසා මිය යන එහෙත් මුදල් ගෙවීම සිදුකිරීමට නොහැකි අය සඳහා මුදල් අය නොකර ආදාහනය කිරීමට කටයුතු කරන බවත්,

අපි අපේ සේවකයින් ආරක්ෂා කරගෙන කටයුතු කරගෙන යන බවත් නමුත් ආරක්ෂිත උපකරණ ආදාහනාගාරයේ සේවකයින්ට ලබා දී නොමැති බවට තොරතුරු කවුරුන් හෝ ලබා දී ඇති බවත් නමුත් එම කාරණය අසත්‍ය බවත් එය නිවැරදි විය යුතු බවත් ගරු මහ සභාවේ අනුමැතියෙන් අවශ්‍ය සියළු දේ සේවකයින්ට සපයා දී ඇති බවත් එක් ආදාහනයකින් අනතුරුව ආරක්ෂිත ඇඳුම් පුළුස්සා දමන බවත් මේ සම්බන්ධයෙන් මහ සභාව දැනුවත් කරන බවත් පරිසර නිළධාරිතුමා ළඟ මේ සම්බන්ධ ඡායාරූප ඇති බවත් කවුරුන් හෝ වැරදි තොරතුරු ලබා දුන්නොත් ඒවා නිවැරදි කරන ලෙස දන්වා සිටින ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මෙය මේ කාලයේ හැටියට ඉතාම අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ඔබතුමා ඉටුකර ඇති බවත් ඉතා කාලෝචිත කාරණයක් බවත් රටේ පවතින වසංගත තත්වය අනුව වෙනත් ප්‍රාදේශීය සභා ආයතන යම් යම් ක්‍රියාමාගර් ගෙන ඇති බවත් සමහර සභා නොමිලේ මිනී පෙට්ටි නිෂ්පාදනය කර අඩු ආදායම්ලාභී අසරණ ජනතාවට ලබාදීමට කටයුතු කරන ප්‍රවෘත්තියක් දුටු බවත් එනිසා අප සභාවෙන් සෑම පුද්ගලයෙකුටම නොව අඩුපාඩුකම් ඇති දැඩි දරිද්‍රතාවයෙන් පෙලෙන අසරණ ජනතාවට කොරෝනා වසංගත ලොක්ඩවුන් කාලසීමාවට පමණක් අදාළව ග්‍රාම නිළධාරිගේ වාර්තාව සමඟ අවස්ථාව ලබාදීම ඉතාම හොද කටයුත්තක් ලෙස සලකා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

මෙය වැදගත් යෝජනාවක් බවත් බල ප්‍රදේශයේ වසංගත තත්වය නිසා ඇති වන අසීරු අවස්ථා වලදී ඔබතුමා ගරු මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගන්නා ලද තීන්දු තීරණ සම්බන්ධයෙන් අපගේ ගෞරවණීය ස්තුතිය ඔබතුමා වෙත පිරිනමන බවත් මරණ සම්බන්ධයෙන් වගකීම් භාර නොගන්නා අවස්ථා වල ලොක් ඩවුන් කාල සීමාව තුළ යම්කිසි කෙනෙකුට ආදාහන කටයුතු ඉටු කර ගැනීමට නොහැකි වන අවස්ථා වලට පමණක් අවස්ථාව ලබාදීම සුදුසු බවත් තව සෑහෙන කාලයක් මෙහි බලපෑම තිබිය හැකි බවත් යම්කිසි කෙනෙකුට උදව් අවශ්‍ය අවස්ථා වල ඔබතුමා මැදිහත් වී වැඩ කටයුතු කරගෙන යන ලෙසත් ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදි.

<u>ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමා</u>

මේ කාලය තුළ ගරු සභාපතිතුමා කල සේවාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරයෙකු ලෙස ස්තුතිවන්ත වන බවත් ඔබතුමා දැනුවත් කරන තෙක් මේ සම්බන්ධයෙන් අපි නොදැන සිටි බවත් මේ දින වල සභාව සමඟ අපගේ සම්බන්ධතාවය අඩු බවත් විශේෂ දෙයක් දැනුවත් කිරීම සඳහා තිබෙනවා නම් උඩපලාත ප්‍රාදේශීය සභාව මඟින් සකස් කර ඇති වට්ස්ඇප් ජාලය හරහා මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කරන ලෙසට සඳහන් කරන ලදි.එවිට සභාව මඟින්

කරන වැඩ කටයුතු සම්බන්ධයෙන් අප දැනුවත් නිසා අසත්‍ය තොරතුරු පතුරුවාලීමට ඉඩකඩ නොමැති බවත් සඳහන් කරන ලදි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

කොවිඩ් වසංගතය නිසා දරුණු අනතුරකට තමාගේ කොට්ඨාශයේ ජනතාව පත් වී ඇති බවත් තමාට ජනතාව හමු වීමට නොහැකි තත්වයක් උදා වී ඇති බවත් ළඟම ඥාතීන් මිය ගිය බවත් අටුවාවත්ත වසමේ දෙදෙනෙකු කොවිඩ් සෑදී දෙදෙනෙකු මිය ගිය බවත් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද සභාව මඟින් සිදු කරනවා නම් තමාගේ කොට්ඨාශය සම්බන්ධයෙන් මුලින්ම සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තමා කිසි දිනක වැරදි තීන්දු තීරණ නොගන්නා බවත් එසේම ගරු සභාව කිසි දිනක තමාගේ තීරණ වලට විරුද්ධව නොගිය බවත් හදිසියේ දින 8ක දරුවා ගැන ඇති වූ තත්වය සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කිරීමට නොහැකි වූ බවත් ගරු කීතරී මන්ත්‍රීතුමා සඳහන් කල පරිදි විෂබීජහරණය කිරීමට විශාල ගැටළුවක් පවතින බවත් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කායර්ාලයෙන් නිරෝධායනය කරන කිසිම නිවසකට විෂබීජහරණ සඳහා යාමට ඉඩ නොදෙන බවත් කොරෝනා සෑදුනු ගෙදරකට යාමට අවසර නොදෙන බවත් පොදු ස්ථාන පමණක් විෂබීජහරණය කිරිමට ඉඩ දෙන බවත් ඔබතුමන්ලා දෙන සහයෝගයට තමා ස්තුතිවන්ත වන බවත් ඉදිරියේදි වට්ස්ඇප් හරහා දැනුවත් කිරීම් ලේකම්තුමිය විසින් සිදු කරන බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

**<u>කමර්ාන්ත අනුමැතිය</u>**

**<u>කමර්ාන්ත යෝජනා</u>**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතාගේ **යෝජනා**</u>

(5) (2.1)ගම්පොල ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරි මහතාගේ නිවස අසල මාගර්ය සංවධර්නය කිරීම රු. 300000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

(5) (2.2)අමුනුපුර නැඩිසා ජනපදයේ මල්ලිකා සෙනෙවිරත්න මහත්මියගේ නිවස අසල වැසිජල කානුව සංවධර්නය කිරීම රු.350000.000

**<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා</u>**

(5) (2.3) ගනේගොඩ ග්‍රාමසේවා වසමේ පිහිඹියාහේන පහල කොටසේ බෝධිය අසල මාගර්ය සංවධර්නය කිරිම රු.200000.00 කමර්ාන්ත වෙනුවට සංශෝධන ලෙස

ඉල්ලගොල්ල දංකැලේ මාගර්යේ ප්‍රමිතා මහත්මියගේ නිවස අසල මාගර්යේ පැති බැම්ම ඉදිකිරීම රු.200000.00 ලෙස යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු මංජුල දිසානායක මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

(5) (2.4) වහුගපිටියේ සිට පහලවෙල ගම හරහා යන මාගර්ය සංවධර්නය කිරිම රු.300000.00 කමර්ාන්තය, වජ්ලි ජනපදයේ ගම මැද මාගර්ය සංවධර්නය කිරිම රු.150000.00 කමර්ාන්තය, වහුගපිටිය සරස්වති පාසල අසලින් මාගර්යේ බෝක්කුව ඉදිකිරිම රු.100000.00 කමර්ාන්තය, වජ්ලි ජනපදයේ පාර දෙක කෝවිල අසල ඇති බෝක්කුව ඉදිකිරිම.150000.00 කමර්ාන්තය යන කමර්ාන්ත වෙනුවට සංශෝධන කමර්ාන්තය ලෙස,

වහුගපිටියේ සිට පහලවෙල ගම හරහා යන මාගර්ය සංවධර්නය කිරිම රු.700000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි

<u>ගරු මුරාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2.5) ඉලංගවත්ත ප්‍රජාශාලාවේ පලවෙනි මහළ සේවා පියස ඉදිකිරිම රු.500000.00 යෝජනාව වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස

1.ඉලංගවත්ත ඔලියාකොටුව අංක 247/A සුමිත් මයාගේ නිවස අසල සිට රාෆි මයාගේ නිවස දක්වා පඩිපෙල හා මාගර්ය සංවධර්නය කිරීම රු 300000.00 හා

2. ඉලංගවත්ත ඔලියාකොටුව අංක 244/B/3,ෆවුස් මයාගේ නිවස අසල කාණු පද්ධතිය සැකසීම රු 200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු අරුණ ප්‍රසන්න මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2 .6) උඩුදෙනිය ජන උදාන ගම්මානයට යන මාගර්ය කොන්ක්‍රිට් කිරිම රු.300000.00 කමර්ාන්තය, මුල්ගම රණවිරු ස්මාරකයට යන මාගර්ය සකස් කිරිම රු.200000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස,

හුණුගල හේනගල මාගර්ය සංවධර්නය කිරිම රු.500000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

5 (2.7) හුණුගල ගම මැදින් යැරෝ දක්වා මාගර්ය සංවධර්නය කිරිම රු200000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස,

හුණුගල ජයසේන මහතාගේ නිවස අසළින් ජයසූරිය මහතාගේ නිවස දෙසල යන මාගර්ය කපා සංවධර්නය කිරීම රු 200000.00 යොදා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

ඉහත සදහන් සංශෝධන කමර්ාන්ත හා සියළු යෝජනා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

ඉහත සදහන් සංශෝධන කමර්ාන්ත හා සියළු යෝජනා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ගිවිසුම් අත්සන් කර ඇති කමර්ාන්ත සියල්ල ඉතා ඉක්මනින් වැඩ අවසන් කරන ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටින ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

(6) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

1. 2021 මැයි මාසයට අදාළ ධාවන සටහන් වාර්තා ඉදිරිපත් කිරීම

2. උඩපළාත ප්‍රාදේශීය සභා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව 2021.06.10

3.2021/06/10 දින කමර්ාන්ත කමිටු වාර්තාව හා 2021/05/21දින කමර්ාන්ත කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

ඉහත සඳහන් කමිටු වාර්තා සියල්ල පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු නීල් සුගත් මන්ත්‍රීතුමා

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

**(7) ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම -**

2021 පෙබරවාරි මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**ආදායම් වියදම් වාර්තාව - 2021 අප්‍රේල්**

| | ආදායම් | | | වියදම් | |
|---|---|---|---|---|---|
| **10** | වරිපනම් හා බදු | | 1 | වැටුප් හා දීමනා | 4,620,353.07 |
| i | වරිපනම් හා බදු | 8,731.65 | | | |
| ii | අක්කර බදු | 1,660.00 | 2 | ගමන් වියදම් | 74,752.00 |
| iii | ජල ගාස්තු | 52,397.00 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| iV | ව්‍යාපාර බදු | 55,700.00 | 118,488.65 | 3 | සැපයුම් හා උපකරණ | 341,008.50 |
| **20** | කුළී | | | | | |
| i | ගෙවල් කුළී | 2,375.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | |
| ii | වෙළඳ අයිතිය බදු දීම | 281,831.25 | | | අළුත්වැඩියාව හා නඩත්තුව | 48,950.00 |
| iii | පොදු වැසිකිළිය | - | | | | |
| iv | බදු මුදල් | - | | | | |
| v | කුලියට දීම | 99,000.00 | 383,206.25 | | | |
| **30** | බලපත්‍ර ගාස්තු | | | | | |
| i | වෙළඳ බලපත්‍ර | 217,250.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යක සේවා | 156,424.26 |
| ii | වෙළඳ බලපත්‍ර ත්‍රිරෝද | 38,400.00 | 255,650.00 | | | |
| **40** | සේවා සඳහා ගාස්තු | | | | | |
| i | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 225,023.78 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 8,487.49 |
| ii | අය කර ගත හැකි ගාස්තු | 1,397,797.44 | 1,622,821.22 | | | |
| **50** | වරෙන්තු ගාස්තු හා දඩ | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| i | දඩ මුදල් | 14,339.58 | 14,346.18 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | 6.60 | | | | |
| **60** | වෙනත් ආදායම් | | | | | |
| i | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| ii | විකුණුම් | 313,766.00 | | | | |
| iii | මුද්දර ගාස්තු | 9,500.00 | | | | |
| iV | සේවක ණය පොලී | 53,080.47 | 376,346.47 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | - |
| i | පරිපාලනමය ප්‍රතිපූර්ණ | 4,032,036.49 | | | | |
| ii | සාමුහික ආධාර | - | 4,032,036.49 | | | |
| **80** | මූලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | - |
| i | මූලධන ආධාර | | - | | සේවක ණය | 266,675.00 |

| | | | |
|---|---|---|---|
| සේවක ණය | 340,897.00 | ණයහිමි ගෙවීම් | 2,713,250.76 |
| තැන්පත් | 390,558.78 | තැන්පත් | 281,829.50 |
| කර්මාන්ත ණයගැති ලැබීම් | - | ආදායමින් ආපසු ගෙවීම් | - |
| අත්තිකාරම් පියවීම | - | අතිරික්තය | |
| ඌනතාවය | 977,379.54 | | |
| | **8,511,730.58** | | **8,511,730.58** |



<u>*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*</u>

2021 අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාවේ මාසයට අදාළ ආදායම දෙස බැලූ කල වරිපනම් බදු,අක්කර බදු,ජල ගාස්තු යන කාරණාවේදී රු.118,488.65 ආදායම් ලෙස ලැබී ඇති බවත් මැයි,ජූනි මාස වන විට මෙම තත්වය කෙසේ වේද කියා බැලිය යුතු බවත් කුළී යටතේ ගෙවල් කුළී,වෙළඳ අයිතිය බදු දීම,කුළියට දීම යටතේ රු.383,206.25 මුදලක්ද ලැබී ඇති බවත් බලපත්‍ර ගාස්තු යටතේ රු.210,250.00 මුදලක්ද වෙළඳ බලපත්‍ර, වෙළඳ බලපත්‍ර ත්‍රීරෝද යන කාරණාවේදී රු.255,650.00 මුදලක් ලැබී ඇති බවත් සේවා සඳහා ගාස්තු,පරීක්ෂණ ගාස්තු යන කාරණාවේදී රු.1,397,797.44 ද එකතුව ලෙස රු.1,622,821.22 මුදලක්ද අප්‍රේල් මස ඒ ඒ පහසුකම් වෙනුවෙන් ලැබී ඇති බවත් මැයි ජූනි මාස වල අපේ ආදායම පහළට යන බවට අදහසක් දීමට සඳහන් කල බවත් සභාවේ මොන තරම් සේවකයින් සිටියත් මේ තත්වය පාලනය කල නොහැකි බවත් මෙය සමස්ථ රටේම පවත්නා තත්වය බවත් වරෙන්තු ගාස්තු හා දඩ යන කාරණාවේදී රු.14,339.58 ද වෙනත් ආදායම් යටතේ රු.376,346.47 ද පරිපාලන ප්‍රතිපූරණ යටතේ රු.4,032,036.49 මුදලක්ද තැන්පත් කිරීම් ලෙස රු.390,558.78 ද මෙම මාසය තුළ ඌනතාවය ලෙස වියදමට සාපේක්ෂව ආදායම් බැලූ කල ඌනතාවය ලෙස රු.977,379.54 මුදලක්ද වියදමට සාපේක්ෂ ලෙස ගැලපීමක් කර ඇති බවත් වියදම් දෙස බැලූ කල ගමන් වියදම් ලෙස රු.74,752.00 ද වැටුප් හා දීමනා ලෙස රු.4,620,353.07ක මුදලක්ද සැපයුම් හා උපකරණ ලෙස රු.341,008.50 ද ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව යටතේ රු.48,950.00 ද ප්‍රාග්ධන වත්කම් ලක්ෂ පහක යහක වියදමක් මාසය තුළ සිදු වී ඇති බවත් මහ ජනතාවගේ කාරණා සඳහා රු.156,424.26ක මුදලක් වියදම් කර ඇති බවත් ණයහිමි ගෙවීම් කමර්ාන්ත ලෙස රු.2,713,250.76 වැය කර ඇති බවත් පරිපාලන ප්‍රතිපූරණර්ය යන කාරණාවේදී අපි ලබා දෙන පහසුකම් වලට මැයි මාසයේ ආදායම් අපට නොලැබෙන බවත් මේ දිනවල ජනතාවට ගැටළු ඇති නිසා සුළු ආදායමක් ලැබෙන බවත් ඉදිරි මාස වල ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය මත සභාවේ ආදායම වැඩිකර ගත යුතු බවත් සඳහන් කරමින් අප්‍රේල් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තා සියල්ල පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව  මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ඉදිරි මහ සභා දිනය තීරනය කල නොහැකි බවත් පවත්නා තත්වය අනුව සභාව පවත්වන බවත් සදහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින සභාවට නොපැමිනි ගරු ***මන්ත්‍රීතුම***න්ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා  සභාවට යොමු කරන ලදි.



**ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා**

මින් ඉදිරියට මහ සභාවට සහභාගී නොවන ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා  ඒ බව ලිඛිතව ගරු සභාපතිතුමාව හෝ ගරු උප සභාපතිතුමාව දැනුවත් කල යුතු බවට අවධාරණය කරමින් අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට මම යෝජනා කරමි

**ගරු පාලිත ජිනදාස මන්ත්‍රීතුමා**

අද දින මාසික මහ සභාවට  සහභාගි නොවු ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම  ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම අවිනිශ්චිත බැවින් දැනුම්දිය නොහැකි බවත් පවත්නා තත්වය අනුව කටයුතු කරමු යැයි සදහන් කරන ලදි.

## 8. වෙනත්

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින කොරෝනා වසංගත තත්වය තිබියදීත් උඩපළාත බල ප්‍රදේශයේ ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් මහ සභාවට සහභාගී වු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාය්‍ර මණ්ඩලයටත් ස්තුතිවන්ත වන බවත් හදිසියේ තිබෙන තත්වය අනුව දුරකථනයෙන් දැනුම්දුන් විට පැමිණ  සභාවට සහභාගී වන ලෙසත් ඉල්ලා සිටිමින් සියළු දෙනාට තෙරුවන් සරණ  ප්‍රාථර්නා කරමින් පෙ.ව.11.30.ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම් | සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව | උඩපළාත ප්‍රාදේශීය සභාව